## ලංසු කැඳවීමේ ආරාධනාවයි

## පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හත (07), චන්ද්‍ර මණ්ඩප රංග ශාලාව සහ දිස්ත්‍රික් ලේකම්/දිසාපති නිල මැඳුර සඳහා උද්‍යාන හා සනීපාරක්ෂක සේවාව ලබා ගැනීමේ ප්‍රසම්පාදනය - 2025/ 2026 වර්ෂය

කොන්ත්‍රාත් අංකය : POL/DST/FRM/07/01/011

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,

පොළොන්නරුව

01. පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හත(07), චන්ද්‍ර මණ්ඩප රංග ශාලාව සහ දිස්ත්‍රික් ලේකම්/දිසාපති නිල මැඳුර වෙනුවෙන් පහත පරිදි උද්‍යාන හා සනීපාරක්ෂන සේවා ලබා ගැනීමට යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ මිල ගණන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් කැඳවනු ලැබේ.

| කොන්ත්‍රාත් අංකය | ප්‍රසම්පාදනයේ නම | ලංසු සුරක්ෂණයේ වටිනාකම | සේවා සැපයිය යුතු ආයතන | සේවය ලබා ගන්නා කාල සීමාව | අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය සහ ලංසු විවෘත කිරීම |
| --- | --- | --- | --- | --- | --- |
| POL/DST/FRM /07/01/011 | පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සංකීර්ණය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හත(07), චන්ද්‍ර මණ්ඩප රංග ශාලාව සහ දිස්ත්‍රික් ලේකම්/දිසාපති නිල මැඳුර සඳහා උද්‍යාන හා සනීපාරක්ෂක සේවාව ලබා ගැනීමේ ප්‍රසම්පාදනය. | රු.315,000.00 | 1.දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය. | වර්ෂයක කාලයක් සඳහා | 2025 ජූනි 27 දින ප.ව.2.00 |
| | | | 2.ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, තමන්කඩුව දිඹුලාගල වැලිකන්ද ලංකාපුර මැදිරිගිරිය හිඟුරක්ගොඩ ඇලහැර | වර්ෂයක කාලයක් සඳහා | |
| | | | 3.චන්ද්‍ර මණ්ඩප රංග ශාලාව. | වර්ෂයක කාලයක් සඳහා | |
| | | | 4.දිස්ත්‍රික් ලේකම්/දිසාපති නිල මැඳුර. | වර්ෂයක කාලයක් සඳහා | |

02. උනන්දුවක් දක්වන සුදුසුකම් සහිත ලංසුකරුවන්ට පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී/ගණකාධිකාරී මගින් (027-2222061) වැඩි විස්තර ලබාගත හැකි අතර, පහත දැක්වෙන ලිපිනයේදී 2025 ජූනි මස 16 දින සිට 2025 ජූනි 26 දින දක්වා සතියේ රාජකාරී දිනවල පෙ.ව.09.00 සිට ප.ව. 03.00 දක්වා කාලය තුළ අවශ්‍ය සුදුසුකම් සහ ලංසු කැඳවීමේ ලේඛණ පරීක්ෂා කර බැලිය හැක.

03. ලිඛිත ඉල්ලුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන රු. 2,000.00 ක මුදලක්, පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සරප් අංශය වෙත මුදලින් පමණක් ගෙවීමෙන් ලංසු කැඳවීමේ ලේඛන කට්ටලයක් ලබා ගත හැක.

04. නිසි ලෙස සම්පූර්ණ කරන ලද ලංසු ලේඛන පහත සඳහන් ලිපිනයට 2025 ජූනි මස 27 දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදීම සිදුකළ යුතුය. ලංසු භාර ගැනීම අවසන් වූ විගස ලංසුකරුවන් ඉදිරියේදී ලංසු විවෘත කිරීම සිදුකරන අතර ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
පොළොන්නරුව.

දුරකතන අංකය : 027-2222061
2025.06.13